මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය -2020
-----------------------------------------------------------

මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹී අංක 2557 / 2558 එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුම්වල II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. කොළඹ මහ නගර සභාව විසින් මහ නගර සභා ප්‍රදේශය ඇතුළත කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ වගකීම දරන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කොලොන්නාව නගර සභාව හා දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශ ඇතුළත කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ වගකීම දරනු ලැබේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් පිළිබඳ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මනා අපජල කළමනාකරණ සේවාවක් සැපයීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ, නාගරික හා උප නාගරික නිවැසියන්ගේ නාගරික පරිසරය හා මහජන සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. අදාල ප්‍රදේශය තුළ ජීවත්වන නිවැසියන් 645,000 ක් සඳහා අපජල කළමනාකරණ සේවා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵලය වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,410 කට සමාන එ.ජ.ඩො මිලියන 116.60 ක් වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු.මිලියන 1,731.70 කට සමාන එජඩො මිලියන 12.60 ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ඉන් රු.මිලියන 1,367.35 කට සමාන එජඩො මිලියන 9.40 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර ඉතිරි මුදල වන රු.මිලියන 364.35 කට සමාන එජඩො මිලියන 3.20 ක මුදල මූල්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. 2009 දෙසැම්බර් 18 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 මාර්තු 30 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද, ව්‍යාපෘති කාර්යයන් 2020 දෙසැම්බර් 31 දින දක්වා කර ගෙන ගොස් තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය
----------------------------

මාගේ වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම
-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | කලමනාකරණයේ අදහස් දැක්වීම් | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද රු.මිලියන 72.19ක් වූ එකතු කිරීමේ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කර තිබුණි. | නිකුත් කරන ලද උපදෙස් ප්‍රකාරව ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කරන විට 2020 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද එකතු කිරීමේ අගය මත බදු රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කරන ලදී. | ශ්‍රී ලංකා රජයෙන් ලත් සම්පූර්ණ දායකත්වය මූල්‍ය ප්‍රකාශනවල වෙන්ව දැක්විය යුතුය. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකුව යටතේ සපයන ලද ණය පහසුකම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ කොළඹ මහනගර සභාව ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරන අතර ආසියානු සංවර්ධන බැංකුව 2020 දෙසැම්බර් 31 දිනට ණය පොළී ලෙස රු.මිලියන 162 ක් අය කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියට අදාල ණය ප්‍රමාණය වෙන්ව හදුනාගැනීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිණි. | 2020 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායතනය අය කර ගන්නා ලද පොළී ගාස්තු හා බැඳීම් ගාස්තු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නැත.<br>මේ සඳහා පැහැදිලි ගිණුම්කරණ උපදෙස් 2021දී නිකුත් කර තිබූ අතර ඒ වන විට ව්‍යාපෘතිය නිම වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ මුළු උපයෝජනය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ කරන ලද සෘජු ගෙවීම් වටිනාකම රු.මිලියන 1,325ක් විය. කෙසේ වුවද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද වාර්තාවල එය රු.මිලියන 1,121.23 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන ශේෂය වූ රු.මිලියන 1,325 තුළ මහ බැංකුවේ අග්‍රිම ගිණුම හරහා සිදු කළ ගෙවීම්, අවසාන බිල් වටිනාකම සහ එකතු කළ අගය මත බදු සහන ලබා ගැනීමට පෙර සිදු කළ එකතු කළ අගය මත බදු ගෙවීම් ඇතුළත් වේ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ශේෂය වූ රු.මිලියන 1,121.23 සහ වෙනස වූ රු.මිලියන 203.76 මූල්‍ය ප්‍රකාශන ශේෂය වූ රු.මිලියන1,325 සමඟ සැසඳීම් කර අමුණා ඇත. | සැසඳීම නිවැරදිව පිළියෙළ කළ යුතුය. (ඒ.ඩී.බී දායකය මඟින් වැට් නිරවුල් කිරීමට ඒ.ඩී.බී අනුමැතිය නොදේ.) |
| (ඈ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිතියම් අංශය වෙනුවෙන් රු.මිලියන2.4 පිරිවැයකට පරිගණක මෘදුකාංගයක් | මිලදී ගත් රු.මිලියන 2.4 ක පරිගණක මෘදුකාංග පැකේජය සිතියම් අංශය වෙත භාර දී ඇති අතර නිවැරදි කිරීමේ ජ'නල් සටහන අමුණා ඇත. | ජල සම්පාදන මණ්ඩලයට ලබා දුන් වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට ක්‍රියා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, එම වටිනාකම මණ්ඩලයට ලබා දුන් වත්කම් ලෙස වෙන්ව පෙන්වනවා වෙනුවට ඒ.ඩී.බී. දායකයට හර කර තිබුණි. | | |
| (ඉ) | එ.ජ.ඩො 556,678 ක් වන අවසන් බිල් වටිනාකම 2020 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය වී නොතිබුණි. කෙසේවුවද, ව්‍යාපෘතිය විසින් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වනවා වෙනුවට විදේශීය දායකත්ව මූලාශ්‍රය යටතේ දක්වා තිබුණි. | 2020 නිකුත් කරන ලද අවසන් කොන්ත්‍රාත් බිල් වටිනාකම වූ එ.ජ.ඩො 556,678ට අයවැය අනුමැතිය නියමිත පරිදි ලබා ගැනීමට 2020 වර්ෂයේ ඇතුළත් කළ යුතුය. නැතහොත් ජංගම වගකීම් නිරවුල් කිරීමට අයවැය අනුමැතියක් නොමැත. අයවැය හුවමාරු ඉල්ලීම අමුණා ඇත. | ගණුදෙනු නිවරැදිව ගිණුම්ගත කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසි සමඟ අනුකූල නොවීම.

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛ අංක එම්.ඕ.එෆ්පී/ඊආර්ඩී/2007/2 අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2021 ඔක්තෝබර් 28 දිනය. | මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු 31 ට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අප අංශයේ කාර්ය මණ්ඩලය කොවිඩ් වසංගතයේ බලපෑමට ලක් වීම නිසා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව 2021 දෙසැම්බර් 31 දින තෙක් අපහට කාලය දීර්ඝ කිරීම් ලබා දෙන ලදී. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල කිරීමට ක්‍රියා කල යුතුය. |
| (ආ) | 2007 මැයි 11 දිනැති ජල සම්පාදන මණ්ඩල චක්‍රලේඛ අංක 13/2007 පරිදි, ව්‍යාපෘතියේ කටයුතු අවසාන වූ පසු ව්‍යාපෘතියේ ඉතිරි වත්කම් පිළිබඳ වාර්තාවක් කළමනාකරු (සැපයුම්) වෙත ලබා දිය යුතුය. කෙසේ වුවද, එම විධිවිධානවලට පටහැනිව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඉතිරි වත්කම් ජල සම්පාදන මණ්ඩලයේ විවිධ අංශ වෙත ලබා දී තිබුණි. | ව්‍යාපෘතිය අවසාන වූ පසු ඉතිරි තොග නඩත්තු කටයුතු තිබෙන ජල සැපයුම් යෝජනා ක්‍රම සඳහා මාරු කරයි. ව්‍යාපෘති කාර්යාලයෙහි පාවිච්චි කරන ලද ඉතිරි තොග ජල සම්පාදන මණ්ඩලය තුළ අවශ්‍ය අංශ සඳහා ලබා දේ. | චක්‍රලේඛයේ උපදෙස්වලට ව්‍යාපෘතිය අනුගත විය යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

## 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) ව්‍යාපෘතිය විසින් සැලසුම් කාර්යය නිසි ලෙස සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, එ.ජ.ඩො **1,834,639** ක් වන විචලන නියෝග **37** ක් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය එම වටිනාකම හා එකඟ වී නොතිබූ අතර බේරුම්කරණ ක්‍රියාවලිය **2020** නොවැම්බර් වන තෙක් කරගෙන ගොස් තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම අනුව, බේරුම්කරණ ක්‍රියාවලියට අනුමැතිය ඇති අතර බේරුම්කරු විසින් ලබා දුන් වාර්තාව මේ සමඟ අමුණා ඇත. එයට එ.ජ.ඩො. **556,678** ක් ගෙවීමට එකඟ වී ඇති අතර එය අවසන් බිල ලෙස ඉදිරිපත් කර ඇත. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘති කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) **2020** දෙසැම්බර් **31** දිනට අවසන් බිල්පතට ගෙවීම් කර නොතිබියදීත් ව්‍යාපෘතිය වත්කම් ප්‍රාග්ධනිත කිරීම් ආරම්භ කර තිබුණි. | ජල සම්පාදන මණ්ඩලය පැත්තෙන් අවසන් බිල ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇති අතර ව්‍යාපෘති වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ප්‍රාග්ධනිත ක්‍රියාවලියට ගෙන ඇත. | අවසන් බිල උපයෝජනයෙන් පසු වත්කම් ප්‍රාග්ධනිත කිරීම් ආරම්භ කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩු දෙන කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව **2020** දෙසැම්බර් **31** දිනට කෙරී ගෙන යන වටිනාකම රු.මිලියන **1,414.26**ක් විය. කෙසේ වුවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘතියට අදාල කෙරී ගෙන යන වැඩ වටිනාකම පෙන්වා නොතිබුණි. | ආසියානු සංවර්ධන බැංකුවේ ඉල්ලීම මත ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට පෙර කෙරී ගෙන යන වැඩ වටිනාකම රු.මිලියන **1,414.26** ක්ව තිබියදී මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන ලදී. | ව්‍යාපෘති කටයුතු නිම වූ පසු ව්‍යාපෘතියේ ප්‍රාග්ධනිත කිරීම් ආරම්භ කළ යුතුය. |

**3.3 පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) 1978 දෙසැම්බර් 19දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ව්‍යාපෘතිය තොග අයිතම පිළිබඳ වාර්තා නඩත්තු කරන අතර වෙනත් අංශවලට ලබා දෙන ලැප්ටොප් යන්ත්‍ර තොරතුරු විගණනයට ලබා දෙන ලදී. | ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කළ යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 133 සහ 2016 ජුනි 10 දිනැති කළමනාකරණ විගණන චක්‍ර ලේඛ අංක 02/2016 පරිදි සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ ගනුදෙනු සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | වරින්වර ව්‍යාපෘතියේ වාර්තා අභ්‍යන්තර විගණකවරු පරීක්ෂා කරන ලදී. | අභ්‍යන්තර විගණනය මඟින් ව්‍යාපෘති කටයුතු විගණනය කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය |